# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 77 —1973 සැප්තැම්බර් 14 වැනි සිකුරාදා — 1973.09.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# 1 වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — | ආණ්ඩුවේ නිවේදන ... ... ... | 933 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය ... | 927 | මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත් කිරීම් ආදිය ... | 928 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — | ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත් කිරීම් ආදිය .... | 928 | ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන ... ... | — |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 931 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 940 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — | " සුරාබදු ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... ... | — |


සැළකිය යුතුයි.—යුක්තිය පසිඳලීමේ පනත් කෙටුම්පත සහ ලංකා ඛණිජ තෙල් සංස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත 1973 සැප්තැම්බර් 07 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කෙ.ටසේ අතිරේකයන් වශයෙන් පළ කරන ලදී.

## ජනාධිපතිතුමාණන් විසින් කරන පත්කිරීම් ආදිය

**1973 අංක 438**

අංකය: ඞී. 298/ආර්ඊසීටී.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත්වීම් අත්හැර යාම් හා පත්කිරීම්**

පත්වීම් අත්හැර යාම්

**1973 අගෝස්තු මස 01 වැනි දින සිට**

බ්‍රිගේඩියර් එම්. එල්. ඞී. ඒ. පෙරේරා—යුද්ධ හමුදා මූලස්ථානයේ පරිපාලන භාර කර්නල් තනතුර අත්හැරීම

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) සී. පී. කල්දේරා, ලසබ—උතුරු ආඥා ප්‍රදේශ ආඥාපති තනතුර අත්හැරීම.

ලුතිනන් කර්නල් ඒ. ඒ. ඞී. බී. පෙරේරා, ලයුයුබ—ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ අණදෙන නිලධාරි තනතුර අත්හැරීම.

ලුතිනන් කර්නල් එස්. සී. රණතුංග, ලසසබ—පළමුවන විමර්ශන රෙජිමේන්තුව, ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ අණදෙන නිලධාරි තනතුර අත්හැරීම.

පත්කිරීම්

**1973 අගෝස්තු මස 01 වැනි දින සිට**

ලුතිනන් කර්නල් (තාවකාලික කර්නල්) සී. පී. කල්දේරා, ලසබ—යුද්ධ හමුදා මූලස්ථානයේ පරිපාලන භාර කර්නල් වශයෙන්.

ලුතිනන් කර්නල් ඒ. ඒ. ඞී. බී. පෙරේරා, ලයුයුබ—ආධාරක සේනා සමූහයේ ආඥාපති වශයෙන්.

ලුතිනන් කර්නල් එස්. සී. රණතුංග, ලසසබ—උතුරු ආඥා ප්‍රදේශයේ වැඩබලන ආඥාපති වශයෙන්.

මේජර් එම්. ඞී. ප්‍රනාන්දු, ලසසබ—පළමුවන විමර්ශන රෙජිමේන්තුව, ලංකා සන්නාහ සන්නද්ධ බලකායේ වැඩබලන අණදෙන නිලධාරි වශයෙන්.

මේජර් එච්. ජී. එච්. ගුණවර්ධන, ලඉ—ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකායේ වැඩබලන අණදෙන නිලධාරී වශයෙන්.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. පී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අගෝස්තු මස 24 දින,
කොළඹ දී ය.

9-419—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරයෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු මස 10 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

**1973 අංක 439**

අංකය : සී/වීඑප්/51 (ඒ).

**සුද්ධ හමුදාව—ශ්‍රී ලං.ස්වේ.බ—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීමක් සහ ඇතුළත් කිරීමක්**

1973 මැයි මස 15 වැනි දින සිට පහත නම සඳහන් මහතාව, යුද්ධ හමුදාවේ ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාවේ දෙවන ලුතිනන් කෙනෙකු වශයෙන් අධිකාරියට පත්කිරීම සහ ඔහුව 2 වන (ස්වේච්ඡා) බල ඇණිය, ගැමුණු සේවා බලකායට ඇතුළත් කිරීම ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් සතුටින් අනුමත කරන ලදී.

කොට්ටහච්චි කන්කානම්ගේ සමරපාල මහතා.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අගෝස්තු 28 දින,
කොළඹ දී ය.

9-329 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 440**

අංකය : සී. 22/ආර්ජීසිපී/245.

**ශ්‍රී ලංකා නාවික හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1973 නොවැම්බර් මස 01 දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායෙන් විශ්‍රාම ගන්නවා ඇත.
ලුතිනන් කොමාන්ඩර් එම්. එච්. වැලිවිටිගොඩ, ශ්‍රී.ලං.නා.හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අගෝස්තු මස 31 වෙනි දින,
කොළඹ දී ය.

9-420 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය

**1973 අංක 441**

**අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :—**

අංකය : අමප. 336/73.

ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ I පන්තියේ බී. ජී. සී. ප්‍රනාන්දු මහතා 1973 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු ගාල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්.

අංකය : අමප. 336/73.

ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ II පන්තියේ සී. ජේ. එන්. සෙනෙවිරත්න මහතා 1973 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්.

අංකය : අමප. 336/73.

ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ II පන්තියේ ඊ. මානික්කවාසගර් මහතා 1973 පෙබරවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු යාපනයේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්.

අංකය : අපම. 271/73.

ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශයේ ලේකම්, ඩබ්ලිව්. ආර්. ජී. තිලකරත්න මහතා, 1973 ජූනි මස 23 දින සිට නැවත නියමයක් කරනතුරු ප්‍රවෘත්ති අධ්‍යක්ෂ වශයෙන්.

අංකය : අපම. 271/73.

සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, පී. එච්. ප්‍රේමවර්ධන මහතා 1973 ජූලි මස 2 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ වශයෙන්,

අංකය : අමප. 136/73.

ශ්‍රී ලංකා පරිපලන සේවයේ, I පන්තියේ II ශ්‍රේණියේ, ඩබ්ලිව්. ඇම්. පී. බී. නාරන්පනාව මහතා 1973 ජනවාරි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන්.

අංකය : අමප. 239/73.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ කේ. වීරවර්ධන මහතා, 1973 අප්‍රේල් මස 2 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, ගොවිජන සේවා කොමසාරිස් වශයෙන් වැඩ බැලීමට.

අංකය : අපම. 271/73.

වානිජ අධ්‍යක්ෂ කේ. බී. දිසානායක මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ මිල පාලක, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ II ශ්‍රේණියේ අයිවන් සමරවික්‍රම මහතා 1973 ජූනි මස 29 වැනි දින සිට තම රාජකරිවලට අමතරව වානිජ අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

අංකය : අමප. 29/73.

සත්වෝද්‍යාන අධ්‍යක්ෂ ඩබ්ලිව්. එල්. ඊ. ද අල්විස් මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ ටී. සිවසම්බු මහතා 1973 ජූනි මස 23 වැනි දින සිට සත්වෝද්‍යාන අධ්‍යක්ෂ තනතුරෙහි රාජකාරීන් හි යෙදීමට.

අංකය : අමප. 327/73.

දේශීය ආදායම් සහකාර කොමසාරිස් එන්. එස්. එල්. පෙරේරා මහත 1973 අගෝස්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු මුදල් අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (තාවකාලික) වශයෙන් වැඩ බැලීමට.

අංකය : අමප. 326/73.

තේ සහ රබර් පාලක, සී. චන්මුගම් මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුළ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ ඩබ්ලිව්. ගුණසේකර මහතා තම රාජකරිවලට අමතරව 1973 ජූනි මස 30 වැනි දින සිට තේ සහ රබර් පාලක වශයෙන් වැඩ බැලීමට.

එම්. එස්. අලීෆ්,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973 අගෝස්තු මස 30 දින.

9-380 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

## අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය

**1973 අංක 442**

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 (5) වැනි වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් අධිකරණ සේවා උපදේශක මණ්ඩලය ලේකම් වෙත පවරන ලද බලතල යටතේ පහත සඳහන් වැඩ බැලීමේ පත්කිරීම් කර ඇත**

කේ. සී. ඊ. ද අල්විස් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1973 සැප්තැම්බර් මස 25 දින සිට කොළඹ දි. උ. අංක 69418/එම් දරණ නඩුව ඇසීමට සහ අසා අවසානකර තීන්දුව දීම පිණිස කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

පී. එදුස්සූරිය මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් මීගමුව මහෙස්ත්‍රාත් උසාවියේ අංක 54144/එන්එස්, 711/බී දිස්ත්‍රික් උසාවිය, 47338, 41975, 15886/කේ, 47382, 33722 සහ 46245 දරණ නඩු ඇසීමට සහ අසා අවසානකර තීන්දුව දීම පිණිස 1973 අගෝස්තු මස 31 දින සිට මීගමුව අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

එස්. ජේ. සී. ද එස්. විජේරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරනතුරු, ඒ. පී. ඩබ්ලිව්. අබේසූරිය මහතා 1973 අගෝස්තු මස 16, 27, 28 දිනයන් හි මාතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

(29) චන්ද්‍රසිරි පිංගෙමත්ත මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(30) ඇස්. ඇම්. ඉසාක් මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(31) කේ. බී. ජයසේකර මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(32) පීරිස් වික්‍රමතිලක මහතා ගාල්ල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(33) ඕ. ඩබ්ලිව්. සුගතදාස මහතා බලපිටිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(34) ඇම්. එච්. බී. ගමගේ මහතා මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

(35) සයිබුලෙබ්බෙ අලියාර් ලෙබ්බෙ හජ්ජියාර් මහතා මඩකලපුව අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද,

පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,
වැඩ බලන අධිකරණ ඇමති.

1973 සැප්තැම්බර් මස 07 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

9-443/2—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

පා 4/2/13. පා 4/2/16.
පා 4/2/15.

සංශෝධනය කිරීම්

(1) 1973. 04. 19 වැනි දින අංක 56 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (I) වැනි ඡේදයේ 1973 අංක 232 දරණ දැන්වීමේ 364 වැනි පිටුවේ 5 ට සඳහන් "අතුරුගිරි ආරච්චිලාගේ ලූවිස් සිංඤෝ" යන්න වෙනුවට "අතුරුගිරි ආච්චිල්ලාගේ ලූවිස් සිංඤෝ" යන්න ආදේශ කිරීමෙන් ද,

(2) 1973. 07. 06 වැනි දින අංක 67 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (I) වැනි ඡේදයේ 702 වැනි පිටුවේ 1973 අංක 335 දරණ දැන්වීමේ අංක 23 ට සඳහන් "පී. කරුණාරත්න" යන්න වෙනුවට "ජී. කරුණාරත්න" යන්න ආදේශ කිරීමෙන් ද,

(3) 1973. 07. 27 වැනි දින අංක 70 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (I) වැනි ඡේදයේ 1973 අංක 368 දරණ දැන්වීමේ 763 වැනි පිටුවේ 9 ට සඳහන් "ඒකනායක මුදියන්සේලාගේ කිරිබණ්ඩා" යන්න වෙනුවට "ඒක්නායක මුදියන්සේලාගේ කළුබණ්ඩා" යන්න ආදේශ කිරීමෙන් ද,

(4) 1973. 08. 24 වැනි දින අංක 74 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (I) වැනි ඡේදයේ 867 වැනි පිටුවේ 1973 අංක 402 දරණ දැන්වීමේ අංක 3 ට සඳහනෙහි "නුවරඑළිය අධිකරණ දිස්ත්‍රික්කය" යන්න වෙනුවට "මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය" සඳහා යන්න ආදේශ කිරීමෙන් ද,

සංශෝධනය කරනු ලැබේ.

රත්නසිරි වික්‍රමනායක,
වැඩබලන අධිකරණ ඇමති.

1973 සැප්තැම්බර් මස 07 වෙනි දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

9-443/3—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

පා 4/4.

අධිකරණ ආඥා පනත

(6 වන අධිකාරිය වූ) අධිකරණ ආඥා පනතෙහි 82 වගන්තිය සමග කියවෙන 83 බී වගන්තිය යටතේ මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, වැඩ බලන අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම,

1. මාජුවාන මැද්දගේ සෙනෙවිරත්න මහතා, කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් කර තිබූ පත්වීම ද,

2. සෙල්ලප්පා සුබ්‍රමනියම් මහතා රත්නපුර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් කර තිබූ පත්වීම ද,

වහාම ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

රත්නසිරි වික්‍රමනායක,
වැඩ බලන අධිකරණ ඇමති.

1973 සැප්තැම්බර් මස 07 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

9-443/1—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 444**

**නිවේදනයයි**

(20 වැනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වැනි වගන්තිය යටතේ වැඩබලන අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය : පා 4/හමප 3/11.

(1) කුලප්පුතන්ත්‍රිගේ කුලරත්න මහතා 1973 ජූලි මස 18 වෙනි දින සිට කළුතර දිස්ත්‍රික්කයේ ඉත්තෑපාන ගම්සභා ප්‍රදේශය සඳහා මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

අංකය : පා 4/හමප 3/12.

(2) තිලකසිරි ඕවිටිගල විතානගේ නොහොත් තෝමස් සිංඤෝ ඕවිටිගල විතානගේ මහතා 1973 අගෝස්තු මස 21 වෙනි දින සිට කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළේ අධිකාරි පත්තුව සඳහා මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

අංකය : ප. 4හමප 6/12.

(3) ජයසේකර මුදියන්සේලාගේ පුංචි බණ්ඩා මහතා 1973 අගෝස්තු මස 17 වෙනි දින සිට නුවරඑළිය දිස්ත්‍රික්කයේ මැදපනේ කෝරළය සඳහා මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

අංකය : පා 4/හමප 7/15.

(4) ධර්මදාස අබේවික්‍රම මහතා 1973 අගෝස්තු මස 08 වෙනි දින සිට ගාල්ල දිස්ත්‍රික්කයේ හිනිදුම් පත්තුවේ මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

පත් කරනු ලැබ ඇත්තේ ය.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ ලේකම්.

1973 සැප්තැම්බර් මස 07 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

9-446—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 445**

අංකය : ජී.බී. 5/43.

රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර අමාත්‍යවරිය විසින් පහත නම් සඳහන් වැඩ බලන සහකාර පොලිස් අධිකාරීන් ඔවුන්ගේ නම් වලට කෙළින් දක්වා ඇති දිනයන්හි සිට සහකාර පොලිස් අධිකාරීන් ලෙස පත්කර තිබේ.

| | |
|---|---|
| 1. එස්. එම්. පී. ඒ. බී. සමරකෝන් මහතා | 71.08.12 |
| 2. එච්. බී. වැලිගොඩපොල මහතා | 71.08.12 |
| 3. එෆ්. එම්. ඊ. විජේසූරිය මහතා | 71.08.12 |
| 4. ජී. ටී. ටී. අමරසේකර මහතා | 71.08.12 |
| 5. ඩී. එම්. ජී. බී. දිසානායක මහතා | 71.08.12 |
| 6. පී. විජේසූරිය මහතා | 71.03.15 |
| 7. එම්. කේ. ජේ. පෙරේරා මහතා | 71.03.15 |
| 8. ඒ. කේ. ඒ. ගඵූර් මහතා | 71.03.15 |
| 9. ඩී. එච්. අබේගුණසේකර මහතා | 71.03.15 |
| 10. එෆ්. එස්. පී. වෙත්තසිංහ මහතා | 71.03.15 |
| 11. එස්. බී. ඩබ්ලිව්. ද සිල්වා මහතා | 71.03.15 |
| 12. ඊ. ඩී. පෙරෙයිරා මහතා | 71.08.12 |
| 13. ජේ. වී. බී. පෙරේරා මහතා | 70.01.01 |
| 14. එම්. ඩී. මැන්දිස් මහතා | 71.03.15 |
| 15. ඩී. බී. ඒ. පෙරේරා මහතා | 72.07.15 |
| 16. ටී. කදිරගාමර් මහත. | 72.07.04 |

ඩී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අගෝස්තු මස 24 දින,
කොළඹ 1.

9-314—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

**1973 අංක 446**

අංකය : ඩී. 251/ආර්ඊසීපී/1.

**ශ්‍රී ලංකා නාවික හමුදුව—නිලධාරීන් ස්ථිර කිරීම**

**1972 නොවැම්බර් 1 වැනි දින සිට උප ලුතිනන්වරු වශයෙන් :**

වැඩබලන උප ලුතිනන් ඩබ්. එම්. ඩී. රත්නපාල, ශ්‍රීලංනාහ.
වැඩබලන උප ලුතිනන් කේ. එස්. කේ. පෙරේරා, ශ්‍රීලංනාහ.
වැඩබලන උප ලුතිනන් ආර්. ගොඩගේ, ශ්‍රීලංනාහ.
වැඩබලන උප ලුතිනන් කේ. ඩබ්. මෙන්ඩිස්, ශ්‍රීලංනාහ.
වැඩබලන උප ලුතිනන් එම්. එම්. ඒ. ජෝතිපාල, ශ්‍රීලංනාහ.
වැඩබලන උප ලුතිනන් ඒ. කැප්පෙටිපොල, ශ්‍රීලංනාහ.
වැඩබලන උප ලුතිනන් ටී.ත්‍යාගලිංගම්, ශ්‍රීලංනාහ.
වැඩබලන උප ලුතිනන් එන්. ඊ. ප්‍රේමදාස, ශ්‍රීලංනාහ.

**1972 නොවැම්බර් 1 වැනි දින සිට උප ලුතිනන් (ඉ) වරු වශයෙන් :**

වැඩබලන උප ලුතිනන් (ඉ) ඒ. එල්. සිල්වා, ශ්‍රීලංනාහ.
වැඩබලන උප ලුතිනන් (ඉ) ඩබ්. කේ. පෙරේරා, ශ්‍රීලංනාහ.

**1972 නොවැම්බර් 1 වැනි දින සිට උප ලුතිනන් (ඩී) වරු වශයෙන් :**

වැඩබලන උප ලුතිනන් (වි) ඩී. පී. නන්දසිරි, ශ්‍රීලංනාහ.
වැඩබලන උප ලුතිනන් (වි) ඒ. ඒ. පෙරේරා, ශ්‍රීලංනාහ.
වැඩබලන උප ලුතිනන් (වි) පී. එස්. ප්‍රනාන්දු, ශ්‍රීලංනාහ.

වි. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

9-421 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 447**

විදේශීය හා දේශීය වෙළඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම් කර ඇත :—

(1) සහකාර වාණිජ අධ්‍යක්ෂ, එන්. එල්. බ්‍රෙකන්රිජ් මහත්මිය, 1973 ජූලි මස 23 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ වාණිජ උපදේශක තනතුරෙහි වැඩ බැලීමට;

(2) එස්. පී. මොරවක මහතා 1973 අගෝස්තු මස 24 වැනි දින සිට සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් වරයෙකු වශයෙන්.

ජයන්ත කැලේගම,
විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ ලේකම්.

**1973 අගෝස්තු මස 31 වැනි දින,**
**කොළඹ 2.**

**9-319**—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**1973 අංක 448**

සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ පහත සඳහන් පත්වීම් කර ඇති බව මෙයින් දන්වනු ලැබේ:—

සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ එච්. බී. කුලතුංග මහතා 1973 අප්‍රියෙල් මස 02 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර වශයෙන්.

සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ එම්. සුප්පිරමනියම් මහතා 1973 මාර්තු මස 02 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පාලන සහකාර වශයෙන්.

සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ ඒ. මහාදේව මහතා 1973 මාර්තු මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර වශයෙන්.

සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ කේ. රත්නසභාපති මහතා 1973 මාර්තු 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර වශයෙන්.

සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ ජී. ඊ. එල්. අපොන්සෝ මහතා 1971 මාර්තු මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර වශයෙන්.

සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ පී. හෙට්ටිගම මහතා 1973 පෙබරවාරි මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු විදේශීය හා දේශීය වෙළෙඳ අමාත්‍යාංශ කාර්යාලයේ කාර්යාල සහකාර වශයෙන්.

සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ බී. සිරිසෝම මහතා 1973 මාර්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු වරාය කොමිෂන් සභාවේ පාලන සහකාර වශයෙන්.

සාමාන්‍ය ලිපිකාර සේවයේ 1 වන පන්තියේ ආර්. රාජසිංහම් මහතා 1973 මාර්තු මස 13 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර තනතුරෙහි වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකාර සේවයේ 1 වැනි පන්තියේ, ඩී. එස්. ජයකොඩි මහතා 1972 දෙසැම්බර් මස 3 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර තනතුරෙහි වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකරු සේවයේ 1 වැනි පන්තියේ, ඩබ්ලිව්. එස්. සිල්වා මහතා 1972 ඔක්තෝබර් මස 02 වැනි දින සිට 1973 පෙබරවාරි මස 26 වැනි දින දක්වා, මොණරාගල පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ කාර්යාල සහකාර වශයෙන් වැඩ බැලීමට.

සාමාන්‍ය ලිපිකාර සේවයේ අධි පන්තියේ, එස්. සිවගුරුනාදන් මහතා 1973 ජූනි මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වශයෙන්.

සාමාන්‍ය ලිපිකාර සේවයේ 1 වැනි පන්තියේ ඒ. ද එස්. වීරක්කොඩි මහතා 1973 අගෝස්තු මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු, සුරාබදු දෙපාර්තමේන්තුවේ පාලන සහකාර තනතුරෙහි වැඩ බැලීමට.

ආර්. එම්. බී. සේනානායක,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.

1973 අගෝස්තු මස 27 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේදී ය.

9-1312 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

# ආණ්ඩුවේ නිවේදන

අංකය :ඩී 330/ආර්ඊසීවී

යුද්ධ හමුදු පනත

(357 වැනි අධිකාරය වන) යුද්ධ හමුදු පනතේ 155 වන වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු ඇමති විසින් පනවනු ලැබූ නියෝගය.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
ආරක්ෂක හා විදේශ කටයුතු
පිළිබඳ ඇමති.

1973 අගෝස්තු 30 දින,
කොළඹදී ය.

නියෝගය

1952 මාර්තු 17 දින අංක 10,085 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර, වරින් වර සංශෝධනය කළ, 1950 සෙබල සේවා රෙගුලාසිවල එච්. වක්‍රයෙහි, අස් කිරීමේ හේතුවට අදාල (XXII) අංකයට ඉක්බිතිවම, පහත සඳහන් නව අංකය ඇතුලත් කිරීමෙන් හා එහි සඳහන් විවිධ කරුණු එකී උප ලේඛනයේ නියමිත තීරුවල ඇතුලත් කිරීමෙන් මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| "(XXIII) ඔහුට රාජ්‍ය භාෂාවෙන් කටයුතු කිරීමට නොහැකි වීමේ ප්‍රතිඵලයක් වශයෙන්" | "ලේකම්" | "නිළධාරි අණදෙන" | "ලේඛණ භාර නිලධාරි" |

9-318/1—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

අංකය : ඩී 330/ආර්ඊසීවී

**නාවික හමුද පනත**

(358 වන අධිකාරය වන) නාවික හමුද පනතේ 161 වන වගන්තිය යටතේ රාජ්‍ය ආරක්ෂක හා විදේශකටයුතු අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝගය.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු
අමාත්‍ය.

1973 අගෝස්තු 30 දින,
කොළඹ දීය.

**නියෝගය**

1950 දෙසැම්බර් මස 9 වන දින අංක 10,187 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබ, වරින්වර සංශෝධනය කරන ලද 1950 නැවියන් බඳවා ගැනීමේ හා සේවා නියෝගවල 15 වන නියෝගයේ (XII) වන ඡෙදයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් ඡෙදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

" (XIII) රාජ්‍ය භාෂාවෙන් කටයුතු කිරීමට නොහැකිවීමේ හේතුවෙන් ඔහුගේ අස්වීම ලබාගැනීමට රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් අවසර දී ඇති තැනැත්තෙක්.''

9-318/2—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

අංකය : ඩී 330/ආර්ඊසීවී

**ගුවන් හමුද පනත**

(359 වන අධිකාරය වන) ගුවන් හමුද පනතේ 155 වන වගන්තිය යටතේ ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් පනවනු ලැබූ නියෝගය.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
ආරක්ෂක හා විදේශ කටයුතු
පිළිබඳ අමාත්‍ය.

1973 අගෝස්තු 30 දින,
කොළඹදී ය.

**නියෝගය**

1951 අප්‍රේල් මස 27 වෙනි දින අංක 10,240 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබ, වරින්වර සංශෝධනය කරනු ලැබූ, 1951 රාජකීය ලංකා ගුවන් හමුද (නිත්‍ය සහ නිත්‍ය උපසේවා) නියෝගවල පස්වන උපලේඛණයෙහි 'ආ' චක්‍රයෙහි (XIV) (ආ) අංකයට ඉක්බිතිවම මෙහි පහත සඳහන් නව අංකය ඇතුලත් කිරීමෙන් හා මෙහි සඳහන් නොයෙකුත් විස්තර එකී උපලේඛනයේ නියමිත තීරුවල දක්වීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| "(XIV) (ඇ) ඔහුට රාජ්‍ය භාෂාවෙන් කටයුතු කිරීමට නො හැකිවීමේ ප්‍රතිඵලයක් වශයෙන්.'' | "ලේකම්" | "නිලධාරි අණදෙන" | "ලේඛණ භාර නිලධාරි" |

9-318/3—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

එල්. ඩී.—බී. 59/41.

**ධීවර ආඥපනත**

(212 වන අධිකාරය වූ) ධීවර ආඥපනතේ 36 වන වගන්තිය සමඟ කියවිය යුතු එහි 33 වන වගන්තිය යටතේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ධීවර අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද නියෝගය.

ජෝර්ජ් රාජපක්ෂ,
ධීවර අමාත්‍යවරයා.

1973 සැප්තැම්බර් මස 6 වන දින,
කොළඹ දී ය.

**නියෝගය**

1. දඩ සත්වාරක්ෂක ආඥපනත යටතේ සාදනු ලැබ 1938 දෙසැම්බර් මස 2 වන දින අංක 8,417 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ :—

(1) 21 වන නියෝගය 21 වන නියෝගයේ (1) වන ඡේදය වශයෙන් නැවත අංක කිරීමෙන්, සහ

(2) 21 වන නියෝගයේ (1) වන ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුලත් කිරීමෙන්—

" (2) කිසිම තැනැත්තකු විසින් පළමුවන උපලේඛනයේ විස්තර කර ඇති යම් වරායක් තුළ මාලු ඇල්ලීමේ කාර්යය සඳහා යම් පාවෙන දැලක් හෝ කරමල් දැලක් නො ඇමිය යුතුය."

9-427—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

**1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත**

1969 අංක 6 දරණ පනතින් සංශෝධිත 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 5 (1) (උඋඋ) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, පිඟන් මැටි ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ලංකා පෝර්ස්ලින් ලිමිටඩ් විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරය 1976 නොවැම්බර් 30 වන දිනෙන් අවසන් වන වසර හතරක කාල පරිච්ඡේදයක් සඳහා ඉහතකී වගන්තියේ කාර්ය පිණිස අනුමත ව්‍යාපාරයක් බවට, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයාගේ නිර්දේශය මත, මෙම දැන්වීම මගින් ප්‍රකාශ කර සිටිමි.

ඇන්. අම්. පෙරේරා,
මුදල් අමාත්‍ය.

1973 අගෝස්තු 30.
කොළඹ දී ය.

9-378—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

ඇල්. සී.—බී. 207/41.

**පඩිපාලක සභා ආඥාපනත**

6 (2) වෙනි වගන්තිය යටතේ නිවේදනය

පහත දැක්වෙන ආඥාව (136 වෙනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 6 (1) වෙනි වගන්තිය යටතේ මවිසින් පනවා ඇති බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 6 (2) වෙනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී ආඥාව 1973 සැප්තැම්බර් මස 15 වැනි දින සිට වලංගු විය යුතුය.

ඇම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු අමාත්‍ය.

1973 සැප්තැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

ඉංජිනේරු කර්මාන්තය පිළිබඳව 1944 ජනවාරි 7 වන දින අංක 9,224 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද, 1944 නොවැම්බර් 24 අංක 9,335 දරන ගැසට් පත්‍රයේ සහ 1958 ජූලි 31 වැනිදින අංක 11,463 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ද පළකරන ලද ආඥාවලින් සංශෝධිත, ආඥාව පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධන කරනු ලැබේ.

(1) "ඉංජිනේරු කර්මාන්තය" සිට "විදුලි ඉංජිනේරු ශිල්පය" දක්වා එන සියළුම වචන අස්කොට, ඒ වෙනුවට පහත සඳහන් කොටස් ආදේශ කිරීමෙන් :—

(1) සිවිල් ඉංජිනේරු ශිල්පය
(2) යාන්ත්‍රික ඉංජිනේරු ශිල්පය
(3) විදුලි ඉංජිනේරු ශිල්පය, සහ
(4) ගුවන් විදුලි සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු ශිල්පය.

(2) (ඒ) "පහත දැක්වෙන කම්කරුවන්ගේ" යන වචනවලට ඉක්බිතිව එන සියළුම අංක වෙනුවට පහත දැක්වෙන අභිනව අංක ආදේශ කිරීමෙන් :—

(1) පට්ටල් කරුවන්
(2) යන්ත්‍ර ශිල්පීන් (යකඩ සහ වානේ වැඩ)
(3) යන්ත්‍ර ශිල්පීන් (ලී වැඩ)
(4) තඹ වැඩකරුවන්
(5) බෙලෙක් වැඩකරුවන්
(6) ඊයම් වැඩකරුවන්
(7) වෑද්දුම්කරුවන්
(8) වයද්මන්වරු හා විදුලි ශිල්පීන්
(9) විදුලි රංජකයන්
(10) ආමචර ඔතන්නන්
(11) ස්‍විච්පුවරු සේවකයන්
(12) බොයිලේරු තනන්නන්, මිටියම් (රිවෙට්) කාරයන්, කෝර්කාරයන්
(13) කම්මල් කරුවන්
(14) කුළුගෙඩිකරුවන්, මිටියෙන් තළන්නන්
(15) වැල්ඩින් කරුවන් හා දවන්නන්
(16) විදුලිමිටි ක්‍රියාකරවන්නන්
(17) ලීස්තරකරුවන් (යකඩ හා පිත්තල)
(18) ඩ්‍රයිවර් මිකැනික්වරුන්
(19) පුරුද්දන්නන්
(20) තව්කාරයන්
(21) පැටලර්වරුන් (යකඩ හා පිත්තල)
(22) උණුකරන්නන් (යකඩ හා පිත්තල)

(23) මෝස්තර හදන්නන්
(24) වඩුවන්, පුරුද්දන්නන්, කැබිනට් සාදන්නන්
(25) බෝට්ටු හදන්නන්
(26) පරීක්ෂකයන් (දැව)
(27) ඉරන්නන්
(28) කෝර්කාරයන් (නට්ටුව)
(29) කියත මුවත් තියන්නන්
(30) මැසින් පිහි මුවත් තියන්නන්
(31) පින්තාරුකරුවන්
(32) සලකුණ අඳින්නන්
(33) පොලිෂ් කරන්නන් (ප්‍රංශ පොලිෂ් ගාන්නන්)
(34) මේසන්වරුන්
(35) දොඹකර පදවන්නන්
(36) බොයිලේරු සේවකයන්
(37) ලාංචි තාංඩෙලේලා, ඩිරයිවර්ලා සහ ඇණිකරුවන්
(38) පාහන්නන් (ලනු හා රුවල් හදන්නන්)
(39) වීදුරු සවිකරන්නන්
(40) ඩිරයිවර්වරු (ඇංජින්)
(41) තෙල් හා වාෂ්ප රෝල් පදවන්නන්, පයර්මන්වරුන්
(42) ෂිප්රයිට්වරු
(43) බෝඩ් හදන්නන්
(44) හූඩ් හදන්නන්
(45) ග්‍රීස් ගසන්නන්
(46) ක්ලීනර්වරු
(47) සෝදන්නන්
(48) මිකැනික්වරු
(49) ටයර් අළුත්වැඩියා කරන්නන්
(50) ටයර් වල්කනයිසින් කරන්නන්
(51) බෙලෙක් වැඩ කරුවන් (මෝටර්)
(52) කංකානම්වරු
(53) නුපුහුණු කම්කරුවන්
(54) වෘත්තීය හදාරන්නන් සහ ආධුනිකයන්
(55) 'මුරකරුවන්
(56) ඉංජිනේරු ගබඩා භාරකාරවරු
(57) කාර්මිකයෝ (ගුවන් විදුලි)
(58) එකලස් කරන්නන්
(59) ට්‍රාන්ස් ෆෝර්මර් සාදන්නන්
(60) බැටරි කේස් සාදන්නන් (ගුවන් විදුලි)
(61) පාස් සන්නන්
(62) සවිකරන්නන් (ඇන)
(63) සිල් තබන්නන්
(64) කොයිල් ඔතන්නන්
(65) කැබිනට් පිරිසිදු කරන්නන්
(66) කටර්ස් (වැසි)
(67) නමන්නන්
(68) ඩයි කාස්ටර්ස්
(69) පින්තාරු කරන්නන් (බෝඩ්, ඩයල්ස් සහ බැජ් යනාදිය)
(70) පරීක්ෂකයන්
(71) පවර් ප්‍රෙස් ඔපරේටර්වරු
(72) අසුරන්නන්
(73) රේඩියෝ මිකැනික්වරු
(74) ඇනොඩයිසර්වරු
(75) පරීක්ෂකවරු, සෙට් ටෙස්ටර්වරු, යුනිට් ටෙස්ටර්වරු
(76) එවර්වරු (අච්චු ගසන ලද බෝඩ් සහ ට්‍රාන්සිස්ටර් සාදන්නන්)
(77) බෆ්ප්‍රින් මැෂින් ඔපරේටර්වරු
(78) සැන්ඩින් මැෂින් ඔපරේටර්වරු
(79) පොලිෂ් කරන්නෝ (රේඩියෝ කැබිනට් සහ අනෙක් කොටස්)
(80) ට්‍රාන්ස්ෆෝමර් වයින්ඩර්ස් සහ එකලාස් කරන්නන්
(81) වියුනර් අලයිනර්වරු

(බී) 1947 ඔක්තෝබර් 24 වන දින අංක 9,790 දරන ගැසට් පත්‍රයේ පළකරන ලදුව පසුව සංශෝධනය කරන ලද ආඥාවේ වෙසෙසා ඇති නෞකාගාර වරාය හා නැව්තොට ප්‍රවාහණ කර්මාන්තයේ කම්කරුවන්ගේ වැඩ හැර ඉහත (ඒ) ඡේදයේ වෙසෙසා තිබෙන වැඩවලට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් කාර්ය ද;

426 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත**

10 වෙනි වගන්තිය යටතේ කරණු ලබන නියෝගය

**කො/නිරිපොල (රෝමානු කතෝලික) සිංහල මිශ්‍ර පාසැල—හංවැල්ල**

අධ්‍යාපන අමාත්‍ය නැන්පත් බද්උද්දීන් මහමුද් වන මම 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධි විධාන) පණතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර අංක 13,314 හා 1962 සැප්තැම්බර් මස 25 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 1,088 දරණ පැවරුම් නියෝගයෙහි උපලේඛනයේ පළමුවන ඡේදයේ සඳහන් දකුණු මායිම පහත සඳහන් අයුරු සංශෝධනය කරණ අතර එම ඡේදයේ අවසානයට පහත සඳහන් (අ) හා (ආ) උපඡේදයන් ද ඇතුලත් කරමි :—

"දකුණෙන් : දේවස්ථානයට වයඹදිගින් පිහිටි දකුණු අංශයේ පාසැල් ගොඩනැගිල්ලේ දකුණු සහ නැගෙනහිර බිත්තිවලට අඩි තුනක් දුරින් හා එම බිත්තිවලට සමාන්තරව බටහිර මායිමේ දකුණු කෙළවරින් පටන්ගෙන දිවෙන කල්පිත රේඛාව, දේවස්ථාන විදුහලේ උස්බිම දිගේ අඩි 70ක් දුරට නැගෙනහිරට ගොස්, එතැනින් දකුණට හැරී අඩි 60ක් දුරට ගොස්, එතැන් සිට ගිනිකොණ දෙසට හැරී දේවස්ථානයට පිවිසීමේ මාර්ගය තෙක් දිවෙයි.

(අ) පවරාගත් භූමියට දකුණෙන් පිහිටි, දේවස්ථානයට පිවිසීමේ මාර්ගය පාවිච්චි කිරීමේ අයිතිය

සහ

(ආ) පවරාගත් භූමිය තුලින් පාසැල් ගොඩනැගිලි දෙක අතරින් උතුරු මායිමේ සිට දේවස්ථානයට මාර්ග අයිතිය."

බද්උද්දීන් මහමුද්,
අධ්‍යාපන ඇමති.

පාප/2/ඒ—89.
අධ්‍යාපන අමාත්‍යාංශය,
කොළඹ 2.
1973.08.28

9–236—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**1961 අංක 13 දරණ වගාරක්ෂණ පනත**

11 (I) වැනි වගන්තිය යටතේ ආඥාවයි

1961 අංක 13 දරණ වගා රක්ෂණ පනතේ 11 (1) වගන්තිය යටතේ කෘෂිකර්ම හා ඉඩම් ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

එච්. එස්. ආර්. බී. කොබ්බෑකඩුව,
කෘෂිකර්ම හා ඉඩම් ඇමති.

1973 අගෝස්තු මස 31 දින,
කොළඹ දී ය.

ආඥාව

1961 අංක 13 දරණ වගා රක්ෂණ පනතේ 11 (1) වගන්තියෙහි කාර්යයන් සඳහා මෙහි පහත දක්වන හේතූන් නියමිත හේතූන් විය යුතුයි :—

1. ජලය නොලැබීම
2. නියඟය
3. ජලය වැඩිවීම
4. ජල ගැලීම
5. ගොයම් රෝග
6. කෘමි වසංගත
7. වල් ඌරන් විසින් කරනු ලබන අලාභය
8. වල් අලින් විසින් කරනු ලබන අලාභය
9. කොමසාරිස්වරයා විසින් අනුමත කරනලද ගොවිතැන් ක්‍රම අනුගමනය කිරීම.

9–345/1—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**1961 අංක 13 දරණ වගා රක්ෂණ පනත**

12 (1) වැනි වගන්තිය යටතේ ආඥාවයි

1961 අංක 13 දරණ වගා රක්ෂණ පනතේ 12 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කෘෂිකර්ම හා ඉඩම් ඇමති හෙක්ටර් සෙනරත් රාජකරුණා බණ්ඩා කොබ්බෑකඩුව වන මම 1973/74 මහ කන්නය දහ හතර වැනි රක්ෂණ වාරය විය යුතු බව මෙම ආඥාවෙන් නියම කරමි.

එච්. එස්. ආර්. බී. කොබ්බෑකඩුව,
කෘෂිකර්ම හා ඉඩම් ඇමති.

1973 අගෝස්තු මස 31 දින,
කොළඹ දීය.

9–345/2—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

## 1961 අංක 13 දරණ වගා රක්ෂණ පනත

24 (1) වැනි වගන්තිය යටතේ නිවේදනය

1961 අංක 13 දරණ වගා රක්ෂණ පනතේ 24 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කෘෂිකර්ම හා ඉඩම් ඇමති හෙක්ටර් සෙනරත් රාජකරුණා බණ්ඩා කොබ්බෑකඩුව වන මම 1973/74 මහ කන්නයේ වී ගොවිතැනට වන්දි ගෙවීමේ දී ගෙවිය යුතු ප්‍රමාණයන් මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ අන්දමට විය යුතු බැව් මෙයින් නියම කරමි.

එච්. එස්. ආර්. බී. කොබ්බෑකඩුව,
කෘෂිකර්ම හා ඉඩම් ඇමති.

1973 අගෝස්තු මස 31 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

| ගොවිතැන් අවස්ථාව | සම්පූර්ණ අලාභ වූ විට ප්‍රමාණය | අලාභය සියයට ගණනින් | අලාභය කොටස් වශයෙන් සිදුවූ විට ප්‍රමාණය |
|---|---|---|---|
| නැවත වරක් වැපිරීමට හෝ පැළ සිටුවීමට නුපුළුවන් කාලයේ සිට පූදින කාලය දක්වා ඇති කාලසීමාව තුළ අලාභය සිදුවූ විට | ගෙවිය හැකි වැඩිම වන්දි ප්‍රමාණයෙන් සියයට 70 | 30 සහ 30 ට අඩු | ... නැත |
| | | 30 ට වැඩි | ... මෙම අවස්ථාවේදී සම්පූර්ණ අලාභයන් සිදුවූ විට ගෙවන වන්දි ප්‍රමාණය හා සමාන සියයට ගණන අලාභයේ සියයට ගණන විය යුතුය. |
| පූදින කාලයේ සිට ගොයම් කපන දිනය දක්වා ඇති කාලසීමාව තුළ අලාභය සිදුවූ විට | ගෙවිය හැකි වැඩිම වන්දි ප්‍රමාණයෙන් සියයට 100 | 30 සහ 30 ට අඩු | ... නැත |
| | | 30 ට වැඩි | ... අලාභයේ සියයට ගණන ගෙවිය යුතු වැඩිම වන්දි ප්‍රමාණයෙන් සියයට ගණන හා සමාන විය යුතුය. |

9–345/3 –73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන ආඥපනත (3) වැනි පරිච්ඡේදය

ඉඩම් සංවර්ධන ආඥ පනතේ 9(1) වැනි ඡේදය යටතේ කෘෂිකර්ම හ ඉඩම් ඇමතිතුමා විසින් පහත නම් සඳහන් නිලධාරීන්, ඔවුන්ගේ නම් ඉදිරියෙන් සඳහන් දිස්ත්‍රික්කයන්හි එහි සඳහන් දිනයන්හි සිට ඔවුන්ගේ රාජකාරි වලට අමතර වශයෙන් ඉඩම් නිලධාරි ලෙස පත්කර ඇත.

එස්. බී. සේනානායක,
අතිරේක ස්ථිර ලේකම්,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය.

1973.08.07

| නිලධාරියාගේ නම | තනතුර | දිස්ත්‍රික්කය | දිනය |
|---|---|---|---|
| අයි. ආදිහෙට්ටි මයා | ...ලිපිකරු සා.ලි.සේ.1 | මාතර | ... 1973.05.01 |
| බී. ඩී. පෙරේරා මයා | ...ජ්‍යෙෂ්ඨ ඉඩම් නිලධාරි ගං.නි.සං. මණ්ඩලය | හම්බන්තොට මොණරාගල සහ යාපනය | 1973.07. 0 |

9–352 –73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

## සාප්පු සහ කාර්යාල සේවකයින් පිළිබඳ සේවය හා වේතන විධිමත් කිරීමේ පනත

### දැන් වීම

(129 වැනි අධිකාරය වන) සාප්පු සහ කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව, කොළඹ නගරයේ පැට්‍රල් පිරවීම සඳහා වූ වේතන විනිශ්චය මණ්ඩලය, යථෝක්ත පනතේ 26 (4) වගන්තියෙන් එයට පැවරී ඇති බලතල පරිදි, 1970 මාර්තු මස 13 වැනි දින අංක 14,987 දරණ ගැසට් නිවේදනයේ පළකරන ලද තීරණය වෙනස් කරමින් පහත සඳහන් කෙටුම්පත් තීරණය කිරීමට අදහස් කරන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

යථෝක්ත කෙටුම්පත් තීරණයට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරුද්ධතාවයන් 1973 ඔක්තෝබර් මස 02 වැනි දින දවල් 12 දක්වා වේතන විනිශ්චය මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන ඒ සෑම විරුද්ධතාවයක්ම එසේ විරුද්ධවීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතුය.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
සභාපති,
ඉහත සඳහන් පැට්‍රල් පිරවීමේ මධ්‍යස්ථානවල හෝ
එම සේවයේ යොදවා ඇති තැනැත්තන් සඳහා වූ
වේතන විනිශ්චය මණ්ඩලය.

1973 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

### කෙටුම්පත් තීරණය

මෙම තීරණය, මෙහි ඇති උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් පැට්‍රල් පිරවීමේ මධ්‍යස්ථානවල හෝ ඒවායේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් හෝ සේවයේ යොදවා ඇති මෙහි පහත සඳහන් වර්ගවල සේවකයින් සඳහා අදාළ විය යුතුය:—

(1) කළමනාකරු,
(2) ගබඩාකරු හා මුදල් භාරකරු,
(3) සහකාර ගබඩාකරු හා මුදල් භාරකරු,
(4) ලිපිකරු,
(5) පොම්පකරු,
(6) කම්කරු.

2. පළමුවෙනි ඡේදයේ සඳහන් යම් පැට්‍රල් පිරවීමේ මධ්‍යස්ථානයක හෝ ඒ හා අදාළ ව්‍යාපාරයෙහි හෝ සේවයෙහි යොදවා ඇති යම් තැනැත්තකුට ගෙවිය යුතු අවම වේතන ප්‍රමාණය පහත සඳහන් ආකාරයට විය යුතුය:—

| සේවක පංතිය | | | මාසික අවම වේතන ප්‍රමාණය රු. ශ. |
|---|---|---|---|
| කළමනාකරු | ... | ... | 350 00 |
| ගබඩාකරු හා මුදල් භාරකරු | | ... | 300 00 |
| සහකාර ගබඩාකරු හා මුදල් භාරකරු | | ... | 225 00 |
| ලිපිකරු | ... | ... | 185 00 |
| පොම්පකරු | ... | ... | 160 00 |
| කම්කරු | ... | ... | 135 00 |

3. මෙම තීරණය සඳහා—

කළමනාකරු යනුවෙන් පැට්‍රල් පිරවීමේ මධ්‍යස්ථානය මුළුමනින්ම භාරව සිටින තැනැත්තා අදහස් වෙයි.

ගබඩාකරු හා මුදල් භාරකරු යනුවෙන් බඩු සහ මුදල් සියල්ලම භාරව සිටින තැනැත්තා අදහස් වෙයි.

සහකාර ගබඩාකරු හා මුදල් භාරකරු යනුවෙන් ගබඩාකරු හා මුදල් භාරකරුගේ වැඩට සහාය වන තැනැත්තා අදහස් වෙයි.

ලිපිකරු යනුවෙන් යතුරු ලියනය සහ ගණන් වැඩ ඇතුළු සම්පූර්ණයෙන්ම හෝ ප්‍රධාන වශයෙන් හෝ ලිපිකාර වැඩ කරන තැනැත්තා අදහස් වෙයි.

පොම්පකරු යනුවෙන් පැට්‍රෝලියම් ද්‍රව්‍ය වාහනවලට දමන, ටයර්වල හුලං පරීක්ෂා කරන, තෙල් ප්‍රමාණය පරීක්ෂා කරන, වාහනයේ වාතාවරණ වීදුරු පිසදමන, නොයෙකුත් මෝටර් උපකරණ විකුණන සහ ගබඩාකරු හා මුදල් භාරකරුට මුදල් භාර දෙන තැනැත්තා අදහස් වෙයි.

කම්කරු යනුවෙන් නුපුහුණු වැඩ කිරීමට යොදන තැනැත්තා අදහස් වෙයි.

## උපලේඛනය

1. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 161, පාර්සන්ස් පාර, කොළඹ 2.
වෙළඳාම්කරු—සී. එෆ්. ද මෙල් සහ පුත්‍රයෝ.

2. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 114, ගාලුපාර, කොළඹ 3.
වෙළඳාම්කරු—ස්ටුවර්ට් ඉංජිනියර්ස්.

3. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 596, ගාලු පාර, කොළඹ 3.
වෙළඳාම්කරු—ඊ. සී. ඊ. මාර්ටින්.

4. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 762, ගාලුපාර, කොළඹ 3.
වෙළඳාම්කරු—කේ. එම්. වික්‍රමසිංහ.

5. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 323, ගාලු පාර, කොළඹ 3.
වෙළඳාම්කරු—ෆිලික්ස් පෙරෙයිරා සහ පුත්‍රයෝ.

6. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 2, ඇල්ප්‍රඩ් හවුස් ගාර්ඩන්ස්, කොළඹ 3.
වෙළඳාම්කරු—සී. දහනායක.

7. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 292, ගාලු පාර, කොළඹ 1.
වෙළඳාම්කරු—ඒ. ආර්. ඇම්. කාසිචෙට්ටි.

8. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 245, බම්බලපිටිය පාර, කොළඹ 4.
වෙළඳාම්කරු—ටී. ආර්. ප්‍රනාන්දු.

9. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 267, ගාලුපාර, කොළඹ 4.
වෙළඳාම්කරු—කේ. එම්. වික්‍රමසිංහ.

10. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 279, ගාලුපාර, කොළඹ 4.
වෙළඳාම්කරු—ෆ්‍රෙඩී ජයසිංහ.

11. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 144, හැව්ලොක් පාර, කොළඹ 5.
වෙළඳාම්කරු—සී. එෆ්. ද මෙල් සහ පුත්‍රයෝ.

12. ලංකා සර්විස් ස්ටේෂන් අංක 169, (171), මායා ඇවනිව් කොළඹ 5.
වෙළඳාම්කරු—ජූ. සී. එච්ස්.

13. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 42, හැව්ලොක් පාර, කොළඹ 5.
වෙළඳාම්කරු—එස්. ද එස්. ජයසිංහ.

14. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 323, හැව්ලොක් පාර, කොළඹ 6.
වෙළඳාම්කරු—එස්. ඒ. එම්. මොහිදීන් සහ සමාගම.

15. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 343, ගාලු පාර, කොළඹ 6.
වෙළඳාම්කරු—එස්. එම්. වෙල්ගම.

16. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 492, ගාලු පාර, කොළඹ 6.
වෙළඳාම්කරු—එම්. පී. වික්‍රමසිංහ.

17. ලංකා සර්විස් ස්ටේෂන්. අංක 426, අංක 462, ගාලු පාර, කොළඹ 6.
වෙළඳම්කරු—කොළඹ සමුපකාරය.

18. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 37, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7.
වෙළඳාම්කරු—වයි. එම්. බී. රත්නායක.

19. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 25, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7.
වෙළඳාම්කරු—එස්. ද එස්. ජයසිංහ.

20. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 30, ඇල්බට් ක්‍රෙසන්ට්, කොළඹ 7.
වෙළඳාම්කරු—එල්. ආර්. කරුණාතිලක.

21. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 75, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7.
වෙළඳාම්කරු—ෆිලික්ස් පෙරේරා සහ පුත්‍රයෝ.

22. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 10, ග්‍රීන් පාත්, කොළඹ 7.
වෙළඳාම්කරු—ටී. සී. ප්‍රනාන්දු.

23. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 41, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ 8.
වෙළඳාම්කරු—ඊ. ඒ. පී. එදිරිසිංහ.

24. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 94, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ 8.
වෙළඳාම්කරු—ඒ. ඊ. වොන්ඩර්පෝල් සහ සමාගම.

25. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 825, බේස්ලයින් පාර, කොළඹ 9.
වෙළඳාම්කරු—සීමාසහිත කොළඹ සමුපකාර සමිති සංගමය

26. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 693, බේස්ලයින් පාර, කොළඹ 9.
වෙළඳාම්කරු—ඊ. ඒ. පී. එදිරිසිංහ.

27. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 291, සිරි සංඝරාජ මාවත, කොළඹ 10.
වෙළඳාම්කරු—එස්. කනපතිචෙට්ටි.

28. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 650, දෙවෙනි මරදාන, කොළඹ 10.
වෙළඳාම්කරු—සීමාසහිත කොළඹ සමුපකාර සමිති සංගමය.

29. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 680, දෙවෙනි මරදාන, කොළඹ 10.
වෙළඳාම්කරු—එච්. ජී. ඩී. විජේසිරිවර්ධන.

30. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 319, සිරි සංඝරාජ මාවත, කොළඹ 10.
වෙළඳාම්කරු—වීරකෝන් සහෝදරයෝ.

31. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 515, ටී. බී. ජයා පාර, කොළඹ 10.
වෙළඳාම්කරු—ඊස්ටන් මෝටර් ගරාජ්.

32. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 4 බී/2, නිව් රෙක්ලමේෂන් පාර, කොළඹ 11.
වෙළඳාම්කරු—සිලෝන් ෂිපින් ලයින්ස්.

33. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 341, නොරිස් පාර, කොළඹ 11.
වෙළඳාම්කරු—ගිල්බට් සහ ඊවන්.

34. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 29, කයිසර් වීදිය, කොළඹ 11.
වෙළඳාම්කරු—බී. තෝමස් සිංඤෝ.

35. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 253, ජෝර්ජ්, ආර්. ද සිල්වා මාවත, කොළඹ 13.
වෙළඳාම්කරු—ඊ. එස්. ප්‍රනාන්දු.

36. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 353, ජෝර්ජ් ආර්. ද සිල්වා මාවත, කොළඹ 13.
වෙළඳාම්කරු—සීමාසහිත කොළඹ සමුපකාර සමිති සංගමය.

37. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 125, ජෝර්ජ් ආර්. ද සිල්වා මාවත, කොළඹ 13.
වෙළඳාම්කරු—බී. ඩී. එස්. ගුණසේකර.

38. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 271, බේස්ලයින් පාර, කොළඹ 9.
වෙළඳාම්කරු—ඩී. වී. විජේසූරිය.

39. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 291, බේස්ලයින් පාර, කොළඹ 9.
වෙළඳාම්කරු—ඒ. සංඝදාස සිල්වා.

40. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 115, වොල්ෆෙන්ඩෝල් වීදිය, කොළඹ 13.
වෙළඳාම්කරු—සීමාසහිත කොළඹ සමුපකාර සමිති සංගමය.

41. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 502, ප්‍රින්ස් ඔෆ් වේල්ස් ඇවනිව්, කොළඹ 14.
වෙළඳාම්කරු—වීරකෝන් සහෝදරයෝ.

42. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 363, 379, ප්‍රින්ස් ඔෆ් වේල්ස් ඇවනිව්, කොළඹ 14.
වෙළඳාම්කරු—එන්. ඩබ්ලිව්. ජයරත්නම්.

43. ලංකා ෆිලින් ස්ටේෂන් අංක 145, ස්ටේස් පාර, කොළඹ 14
වෙළඳාම්කරු—එල්. ඒ. පෙරේරා.

44. ලංකා ෆිලින් ස්ටේෂන් අංක 19, ජේතවන පාර, කොළඹ 14.
වෙළඳාම්කරු—සී. එෆ්. ද මෙල් සහ පුත්‍රයෝ.

45. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 24, ජේතවන පාර, කොළඹ 14.
වෙළඳාම්කරු—කේ. ගුණරත්නම්, එම්. රාමස්වරම්.

46. ලංකා සර්විස් ස්ටේෂන්, අංක 481ඒ, ප්‍රින්ස් ඔෆ් වේල්ස් ඇවනිව්, කොළඹ 14.
වෙළඳාම්කරු—ජේ. එස්. ඒ. ප්‍රනාන්දු.

47. ලංකා ෆිලින් ස්ටේෂන්, අංක 84, ශාන්ත ඇන්ඩෘස් පාර, කොළඹ 15.
වෙළඳාම්කරු—එම්. ඩබ්ලිව්. ජයරත්න.

48. ලංකා සර්විස් ස්ටේෂන්, ගාලු පාර, කොළඹ 3.
වෙළඳාම්කරු—සීමාසහිත වෝකර් පුත්‍රයෝ සහ සමාගම.

49. ලංකා ෆිලින් ස්ටේෂන්, ධර්මපාල මාවත, කොළඹ 3.
වෙළඳාම්කරු—සීමාසහිත රෝලන්ඩ්ස්.

50. ලංකා ෆිලින් ස්ටේෂන්, ඇල්ස්ටන් පෙදෙස, කොළඹ 2.
වෙළඳාම්කරු—සීමාසහිත බ්‍රිටිෂ් කාර් සමාගම.

51. ලංකා ෆිලින් ස්ටේෂන්, රජින වීදිය, කොළඹ 1.
වෙළඳාම්කරු—සීමාසහිත බෝගල මෝටර්ස්.

52. ලංකා සර්විස් ස්ටේෂන්, ඩීන්ස් පාර, කොළඹ 10.
වෙළඳාම්කරු—ආර්. එස්. කුක්.

53. ලංකා ෆිලින් ස්ටේෂන්, ප්‍රින්ස් ඔෆ් වේල්ස් ඇවනිව්, කොළඹ 14.
වෙළඳාම්කරු—බ්‍රෝඩ්වේ ඔටෝමෝටිව්ස්.

54. ලංකා ෆිලින් ස්ටේෂන්, ජේතවන පාර, කොළඹ 14.
වෙළඳාම්කරු—සෝමපාල කෝපරේෂන්.

55. ලංකා ෆිලින් ස්ටේෂන්, පාසන්ස් පාර, කොළඹ 2.
වෙළඳාම්කරු—එස්. ඒ. මොහිදීන් සහ සමාගම.

56. ලංකා ෆිලින් ස්ටේෂන්, ජෙනරල් ලේක් පාර, කොළඹ 2. වෙළඳාම්කරු—ආර්. ජනාකීරම් සහ සමාගම.

57. ලංකා ෆිලින් ස්ටේෂන්, හයිඩ් පාක් කෝනර්, කොළඹ 2. වෙළඳාම්කරු—රිචඩ් පීරිස් සහ සමාගම.

58. ලංකා ෆිලින් ස්ටේෂන්, යූනියන් පෙදෙස, කොළඹ 2. වෙළඳාම්කරු—සීමාසහිත සී. ඒෆ්. ටී. ඉන්ජිනියර්ස් වර්ක්ස්

59. ලංකා ෆිලින් ස්ටේෂන්, යූනියන් පෙදෙස, කොළඹ 2. වෙළඳාම්කරු—සීමාසහිත බ්‍රවුන් සහ සමාගම.

9-396 –73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

### 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (පරිපූරක විධිවිධාන) පනත

#### 10 වෙනි වගන්තිය යටතේ නියෝගය

#### පු/තඹබෝව (රෝමානු කතෝලික) සිංහල මිශ්‍ර පාසල, තඹබෝව

අධ්‍යාපන අමාත්‍ය තැන්පත් බද්උද්දීන් මහමූද් වන මම 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (**පරිපූරක** විධිවිධාන) පනතේ 10 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අංක 13,345 හා 1962 ඔක්තෝබර් 12 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළවූ අංක 1968 දරණ පැවරුම් නියෝගයෙහි උපලේඛනයේ පළමුවන ඡේදය පහත සඳහන් අයුරු මෙයින් සංශෝධනය කරමි :—

1960 ජූලි මස 21 වෙනි දින, ඉහත සඳහන් පු/තඹබෝව (රෝමානු කතෝලික) සිංහල මිශ්‍ර පාසල පැවැත්වූවාවූත්, නඩත්තු කරනු ලැබූවාවූත්, වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දෙමළ හත්පත්තුවේ තඹබෝවෙහි පිහිටි ස්ථානය, එනම් :

උතුරෙන් : අනුරාධපුර තඹබෝව මහා මාර්ගයෙන් ද, (මෙම මායිම අඩි 179 ක් දුරට දිවෙයි),

නැගෙනහිරෙන් : ජී. වින්සන්ට් ප්‍රනාන්දුට අයත් ඉඩමෙන් ද,

දකුණෙන් : පාසල් ගොඩනැගිල්ලේ දකුණු බිත්තියේ සිට අඩි 120 ක් දුරින් හා ඊට සමාන්තරව දිවෙන රේඛාවකින් ද,

බටහිරින් : දේවස්ථානයේ නැගෙනහිර බිත්තියේ සිට අඩි 44 ක් දුරින් හා ඊට සමාන්තරව දිවෙන රේඛාවකින් ද මායිම් වූ අක්. 1, රූඩ 0, පර්චස් 20 ක් පමණ වූ බිම් ප්‍රමාණය,

සහ

අනුරාධපුර තඹබෝව මහා මාර්ගයේ සිට දේවස්ථාන භූමියට පිවිසීමේ මාර්ගය පාවිච්චි කිරීමේ අයිතිය,

සහ

පාසලේ බාහිර කටයුතු සඳහා දේවස්ථාන භූමිය පාවිච්චි කිරීමේ අයිතිය.

බද්උද්දීන් මහමූද්,
අධ්‍යාපන ඇමති.

පාප/16/42,
අධ්‍යාපන අමාත්‍යාංශය,
කොළඹ 2,
73.08.28.

9-235—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

### හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය ප්‍රතිසංස්ථාපනය කිරීම

**1973 ඔක්තෝබර් මස 1 වැනි දින සිට හම්බන්තොට පාලන දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි** කොට්ඨාශය, වීරකැටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය සහ කටුවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය යනුවෙන් කොට්ඨාශ දෙකකට බෙදා වෙන් කරනු ලබන බැව් මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2. වීරකැටිය නව ප්‍රාදේශීය ආදායම් නිලධාරි **කොට්ඨාශය සහ** කටුවන නව ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය **පහත සඳහන්** ග්‍රාම සේවක කොට්ඨාශවලින් සමන්විත වනවා ඇත :—

**ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය—වීරකැටිය**

| | |
|---|---|
| 494 | වලස්මුල්ල |
| 495 | බෝවල |
| 495 ඒ | මුරුතවෙල |
| 497 | ගලහිටිය |
| 498 | ඉත්තදෙමලිය |
| 499 | තලහගම්වාඩුව |
| 500 | කණුමුල්දෙනිය නැගෙනහිර |
| 500 ඒ | කණුමුල්දෙනිය බටහිර |
| 501 | කඩිගමුව |
| 503 | කණුමුල්දෙනිය දකුණ |
| 505 | යටිගල |
| 506 | මොදරවාන |
| 507 | වාච්චි-දළුවක්ගොඩ |
| 525 | ජුලම්පිටිය |
| 527 | හීල්ලගෙඅසින |
| 528 | මුල්ගිරිගල |
| 529 | මණ්ඩාඩුව |
| 531 | යක්ගස්මුල්ල |
| 532 | බුද්දියගම |
| 533 | කිංචිගුනේ |
| 533 ඒ | මැදමුලන |
| 534 | ගෝනදෙනිය |
| 534 ඒ | වැකන්දවල |
| 535 | බැදිගම |
| 570 | කුඩගල්ආර |
| 576 | ඔකන්දයාය |

**ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය—කටුවන**

| | |
|---|---|
| 509 | වෙළුදගොඩ |
| 510 | පිගලැල්ල |
| 511 | වරාපිටිය |
| 512 | පාතෙගම |
| 513 | හඳුගල |
| 514 | ඒගොඩබැද්ද |
| 515 | හොරේවෙල |
| 516 | රදනිආර |
| 517 | වල්ගම්මුල්ල |
| 518 | කටුවන |
| 519 | රුක්මල්පිටිය |
| 520 | හොරවින්න |
| 521 | ගඟුලන්දෙනිය |
| 522 | සියාරපිටිය |
| 523 | උඩගොමඩිය |
| 524 | තල්වත්ත |
| 526 | බූකැන්දයාය |
| 569 | මිද්දෙනිය |
| 569 ඒ | මුරුංගගස්යාය |
| 574 | ලබුහේන්ගොඩ |
| 575 | සපුගහයාය |
| 575 ඒ | කුඩගොඩ |
| 577 | මැල්ලකැටිගොඩ |
| 578 | වැලිපිටිය |

3. වීරකැටිය නව ප්‍රාදේශීය ආදායම් නිලධාරි **කොට්ඨාශයට සහ** කටුවන නව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයට ඇතුළත්වන ප්‍රාදේශීය බලමණ්ඩල පහත දැක්වේ :—

**ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය—වීරකැටිය**

(i) වලස්මුල්ල සුළු නගර සභා ප්‍රදේශය.

(ii) කිරම ගම්සභා ප්‍රදේශය (කොටසක්).

(iii) වීරකැටිය ගම්සභා ප්‍රදේශය.

(iv) මිද්දෙනිය ගම්සභා ප්‍රදේශය (කොටසක්).

**ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය—කටුවන**

(i) කිරම ගම්සභා ප්‍රදේශය (කොටසක්).

(ii) මිද්දෙනිය ගම්සභා ප්‍රදේශය (කොටසක්).

4. පහත සඳහන් ගම්බද උසාවි වීරකැටිය නව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය සහ කටුවන නව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ අධිකරණ බල පවත්වනවා ඇත :—

**ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය—වීරකැටිය**

(i) ගම්බද උසාවිය—වලස්මුල්ල.

(ii) ගම්බද උසාවිය—වීරකැටිය.

(iii) ගම්බද උසාවිය—මිද්දෙනිය.

**ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය—කටුවන**

(i) ගම්බද උසාවිය—කිරම.

(ii) ගම්බද උසාවිය—මිද්දෙනිය.

(iii) ගම්බද උසාවිය—වීරකැටිය.

5. වීරකැටිය නව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය සහ කටුවන නව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය පහත සඳහන් මැතිවරණ කොට්ඨාශයට ඇතුලත් වේ :—

**ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය—වීරකැටිය**

72—මුල් ගිරිගල මැතිවරණ කොට්ඨාශය.

**ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය—කටුවන**

72—මුල් ගිරිගල මැතිවරණ කොට්ඨාශය

6. වීරකැටිය නව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ සහ කටුවන නව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කාර්යාලයන් පහත සඳහන් ස්ථානයන් හි පිහිටුවනවා ඇත :—

**වීරකැටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලය**

වීරකැටිය

**කටුවාන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලය**

කටුවන

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 සැප්තැම්බර් මස 6 වැනි දින,
කොළඹ 7,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ දීය.

9-408—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

අංක : ඊ 23/කො. 129/73.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත,**

4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිත කර දක්වා ඇති කාරණය පිළිබඳව ඊ. සී. විජේසිංහ මහතා 14, ජයසුමනාරාම පාර, රත්මලාන, ගල්කිස්ස සහ ඇලයිඩ් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්, තැ. පෙ. 1034, කොළඹ, අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා කම්කරු විනිශ්චය සභා අංක 1 වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඇම්. පී. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 සැප්තැම්බර් මස 03 දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

**ඊ. සී. විජේසිංහ මහතා, 14, ජයසුමනාරාම පාර, රත්මලාන, ගල්කිස්ස.,**

**සහ**

**ඇලයිඩ් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්, තැ. පෙ. 1034, කොළඹ.**

**අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.**

**ආරාවුලට හේතුව පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය**

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණ නම් 68. 06.01 සිට 71. 06. 01 වන දින දක්වා කාලය සඳහා වාර්ෂික වේතනයෙන් 25% ක් දිරිගැන්වීමේ දීමනා වශයෙන් ගෙවන ලෙස කරන ඊ. සී. විජේසිංහ මහතා ඉල්ලීම යුක්ති සහගතද යන්නත් ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

**1973 අගෝස්තු මස 23 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු** කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

**ඩබ්ලිව්. එල්. පී. ද මැල්,**
**කම්කරු කොමසාරිස්.**

9-390—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

අංක ඊ. 23/කො. 23/73.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව ඩබ්ලිව්. ඒ. සී. ගුණවර්ධන මහතා, තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය, සීදුව සහ බ්‍රවුන් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ්, 481 ඩාර්ලි පාර, කොළඹ 10 අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කර ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරණ පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවසථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1950 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගම්පහ පදිංචි ශ්‍රේෂ්ඨාධිකරණයේ පෙරකදෝරු ආනන්ද ජයසිංහ මහතා වෙත මෙයින් යොමු කරනු ලැබේ.

එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 සැප්තැම්බර් මස 03 දින,
කොළඹ දී ය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

ඩබ්ලිව්. ඒ. සී. ගුණවර්ධන මහතා,
තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය, සීදුව

**සහ**

බ්‍රවුන් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ්,
481, ඩාර්ලිපාර, කොළඹ 10,

**අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.**

ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ආරවුලට හේතුවී ඇති කරුණු වනුයේ බ්‍රවුන් ඇන්ඩ් කොම්පැණි ලිමිටඩ්හි පාලක පක්ෂයට එදිරිව ඩබ්ලිව්. ඒ. පී. ගුණවර්ධන මහතා කර ඇති ඉල්ලීම් යුක්ති සහගතද යන්නත්, ඔහුට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

(1) පෙර කරන ලද සේවය සඳහා පාරිතෝෂික දීමනා ගෙවීම.

(2) 1969 මාර්තු මාසයේ සිට 1970 අප්‍රේල් මාසය දක්වා වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම,

යන කරුණු වේ.

1973 අගෝස්තු මස 27 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේදී දින යොදන ලදී.

**ඩබ්ලිව්. එල්. පී. ද මැල්,**
**කම්කරු කොමසාරිස්.**

9-395—73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සමාගම් ආඥා පනත (145 වැනි අධිකාරය)**

277(3) වගන්තිය යටතේ යුනිටි ෆිල්ම්ස් ලිමිටඩ් නම කපාහැරීමේ දැන්වීම

සමාගම් ආඥා පනතේ (145 වැනි අධිකාරය) විධිවිධාන යටතේ 1963 පෙබරවාරි මස 11 දින සංස්ථාපිත සමාගමක් වන යුනිටි ෆිල්ම්ස් ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැත හොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැන්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, යුනිටි ෆිල්ම්ස් ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම් විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් තැන්පත් රුවන්පුර ලික්මන් ද සිල්වා වන මම, සමාගම් ආඥා පනතේ (145 අධිකාරය) 277 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ආර්. ඇල් ද සිල්වා,
සමාගම් රෙජිස්ට්‍රාර්.

1973 අගෝස්තු මස 29 දින,
කොළඹ, සමාගම් රෙජිස්ට්‍රාර්ගේ
දෙපාර්තමේන්තුවේදීය.

9-311 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය**

වයඹ දිසාව පුත්තලම් දිස්ත්‍රික්කය

පුත්තලම අනුරාධපුර පාරේ 10/3 දරණ පාලම ඉතාමත් දුර්වල තත්ත්වයක ඇති හෙයින් මෙම පාලම හරහා ගමන් ගන්නා වාහන වල බර ටොන් 4 කට සීමා කිරීමට සිදු වී ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ. කොළඹින් සහ ආපසු පැමිණෙන බර වාහන කුරුණෑගල හරහා ගමන් කළ හැක.

ඩී. වී. ඒ. සේනාරත්න,
වයඹ දිසා වැඩ අධ්‍යක්ෂ.

9-258 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

කෑ/ශ්‍රී මහ. බෝධි පිරිවෙන ආවාරම-හිඟුල
අස්ථිර වශයෙන් ලියාපදිංචි කිරීම

ඉහත සඳහන් පිරිවෙන 1969.03.20 වෙනි දින සිට රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස අස්ථිර වශයෙන් ලියාපදිංචි කළ බව මෙයින් දන්වමි.

ඩී. බී. මල්ලිකාරච්චි,
කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

මගේ අංකය : කෑ/පාපාඋ/93.
1973 අගෝස්තු මස 30 වෙනි දින.
කෑගල්ල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

9-266 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

කෑ/විද්‍යා ප්‍රකාශ පිරිවෙන—පිලාඹුව වරකාපොල

සබරගමු පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල පිලාඹුවේ පිහිටි ඉහත සඳහන් පිරිවෙන රජයේ ආධාර ලබන පිරිවෙනක් ලෙස ලියා පදිංචි කිරීමට පූජ්‍ය බිසෝවෙල සෝමාලෝක ස්ථවිරයන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ.

මෙම දැන්වීම ප්‍රසිද්ධකල දිනයේ සිට 30 ක් දිනක ඇතුළත මේ ඉල්ලීමට විරුද්ධත්වයක් ඇති නම් මා වෙත දැනුම් දිය යුතුයි.

ඩී. බී. මල්ලිකාරච්චි,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,—කෑගල්ල.

මගේ අංකය : කෑ/පාපාඋ/82.
1973.08.30 දින,
කෑගල්ල,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

9-254 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

**ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව**

දුම්රිය හරස් මග අළුත්වැඩියා කිරීම

උතුරු දුම්රිය මාර්ගයේ සැ. 220 දම්. 27 යන ස්ථානයේ පිහිටි දුම්රිය හරස් මග 1973. 09. 24 දින ප. ව. 4 සිට 73.09.25 දින පෙ. ව. 3 දක්වා අළුත්වැඩියා කිරීම පිණිස වසා තබනු ලැබේ.

අළුත්වැඩියා කරන කාලය තුළදී වැඩ බිමෙහි සාදා ඇති තාවකාලික හරස් මගක් ඔස්සේ යැවීමට කටයුතු කරනු ලැබේ.

ජේ. පෝල් සේනාරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

9-391 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය.

---

**ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව**

දුම්රිය හරස් පාරවල් අළුත්වැඩියා කිරීම

ප්‍රධාන දුම්රිය මාර්ගයේ වලකුඹුර සහ පොල්ගහවෙල දුම්රිය ස්ථාන අතර දුම්රිය සැතපුම් 43 දම්වැල් 40 ස්ථානයේ පහළ මාර්ගයේ අලව්ව ඔස්සේ කුරුණෑගල කොළඹ පාර වැටී ඇති තැන පිහිටි යන්ගල්මෝදර දුම්රිය හරස් මග අලුත්වැඩියා කිරීමට යෝජනා කර ඇත. එමනිසා 73. 09. 22 වැනි සෙනසුරාදා පස්වරු 9.30 සිට 73.09.23 වැනි ඉරිදා පෙරවරු 6 දක්වා සම්පූර්ණයෙන් ද රථවාහන ගමනාගමනයට වසා තබනු ලැබේ.

ප්‍රසිද්ධ මාර්ගය සම්පූර්ණයෙන් වසා ඇති කාලසීමාව තුළදී රථවාහන ගමනා ගමනය :—

(අ) යටිගල්ඔලුව, මොරවලපිටිය, අලව්ව හරහාද,

(ආ) පොල්ගහවෙල කෑගල්ල හරහා නුවර මාර්ගය ඔස්සේ ද,

(ඇ) කහවත්තේ ඇල හන්දියෙන් හැරී වදාකඩ, නාරම්මල, දම්පැලැස්ස හන්දිය හා අලව්ව හරහාද, වෙනස් කරනු ලැබේ.

ජේ. පී. සේනාරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

9-392 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

### ✓ ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

#### දුම්රිය හරස් පාරවල් අළුත්වැඩියා කිරීම

පුත්තලම් දුම්රිය මාර්ගයේ ජාඇල සහ සීදුව දුම්රිය ස්ථාන අතර දුම්රිය සැතපුම් 13 දම්වැල් 54 දරණ ස්ථානයේ මිනුවන්ගොඩ පාර වැටී ඇති තැන පිහිටි දුම්රිය හරස් පාර අලුත්වැඩියා කිරීමට යෝජනා කර ඇත. එමනිසා 1973. 09. 22 වෙනි සෙනසුරාදා පෙරවරු 9 සිට 1973. 09. 22 වෙනි සෙනසුරාදා පස්වරු 6 දක්වාද, 1973.09.23 වෙනි ඉරිදා පෙරවරු 7 සිට 1973.09.23 වෙනි ඉරිදා පස්වරු 4 දක්වා අර්ධ වශයෙන්ද, 1973.09.22 වෙනි සෙනසුරාදා පස්වරු 10 සිට 1973.09.23 වෙනි ඉරිදා පෙරවරු 4 දක්වාද සම්පූර්ණ වශයෙන්ද රථවාහන ගමනාගමනය වසා තබනු ලැබේ.

ප්‍රසිද්ධ මාර්ගය සම්පූර්ණයෙන් වසා ඇති කාලසීමාව තුළදී රථවාහන ගමනා ගමනය :—

(අ) කුඩහකපොල හා ඒකල හන්දියෙන් හරවා දෙහියාගාතට,

(ආ) හෝ වැලිගම්පිටිය හන්දියෙන් හරවා ගනේමුල්ල පාර හරහාද සටහන් කරනු ලැබේ.

පාර අර්ධ වශයෙන් වසා ඇති කාල සීමාව තුළදී එම හරස් මග හරහා වාහන ගමන් කිරීමට ඉඩ දෙනු ලැබේ.

ජේ. පී. සේනාරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

9-393 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

---

### ✓ ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

#### දුම්රිය හරස් පාරවල් අළුත්වැඩියා කිරීම

ප්‍රධාන දුම්රිය මාර්ගයේ කැළණිය සහ හුණුපිටිය දුම්රිය ස්ථාන අතර දුම්රිය සැතපුම් 3, දම්වැල් 50 දරණ ස්ථානයේ කොළඹ-නුවර පාරේ පට්ටිය හංදියේ සිට බියගම පාරට වැටී ඇති ස්ථානයේ පිහිටි, කැළණිය දුම්රිය නැවතුම්පොල පාරේ දුම්රිය හරස් මග අලුත්වැඩියා කිරීමට යෝජනා කර ඇත. එමනිසා 1973. 09.15 වැනි සෙනසුරාද පස්වරු 6 සිට පස්වරු 10 දක්වාද, 1973. 09. 16 වැනි ඉරිදා පෙරවරු 6 සිට පෙරවරු 11 දක්වා අර්ධ වශයෙන්ද, 1973. 09. 15 වැනි සෙනසුරාදා පස්වරු 10 සිට 1973. 09.16 වෙනි ඉරිදා පෙරවරු 6 දක්වා සම්පූර්ණයෙන්ද රථ වාහන ගමනාගමනය වසා තබනු ලැබේ.

ප්‍රසිද්ධ මාර්ගය සම්පූර්ණයෙන් වසා ඇති කාලසීමාව තුළදී රථ වාහන ගමනා ගමනය :—

(අ) කොළඹ-නුවර පාරේ 4 වෙනි කණුව සිට බියගම පාර හරහාද,

(ආ) කොළඹ-නුවර පාරේ තොරණ හංදියේ සිට කැළණිය හරහාද, වෙනස් කරනු ලැබේ.

ජේ. පී. සේනාරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

9-394 —73.09.14 දින අංක 77 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... 73.08.31 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... 73.09.07 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... 73.09.14 | සිකුරාද | දවල් | 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... 73.09.21 | සිකුරාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.